
ප්‍රස්ථාර අංක 04: කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කෘෂි පාරිසරික කලාප දත්ත




**පහතරට තෙත් 1a**

- කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 76% ක පමණ වපසරියක් පහතරට තෙත් 1a යන කෘෂි පාරිසරික කලාපයට අයත්ය. විශේෂයෙන්ම
  කොට්ඨාසයේ උතුරු, දකුණු, බටහිර මෙන්ම වයඹ දිශා ඔස්සේ මෙම කලාපය විසිරී ඇත.
- මෙම කලාපයට විශේෂිත ලක්ෂණ වනුයේ කඳු සහිත රළි බිම් පිහිටා තිබීමත්, ප්‍රධාන පාංශු බාණ්ඩය රතු කහ පොඩ්සොලික් පස වන අතර පාංශු පැතිකඩ ගත් විට A1 ස්ථරය ප්‍රමුඛ නොවීමත්, වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 3200 ට වැඩි වීමත්, වසර පුරා ව්‍යාප්ත වූ වර්ෂාපතනයක් වාර්තා වීමත්, මුහුදු මට්ටමේ සිට මීටර් 300 ට අඩු උච්ඡත්වයක් වාර්තා වීමත්ය.
- උෂ්ණත්වයද සාමාන්‍යයෙන් වසර පුරා පවතින ඒකාකාරි උෂ්ණත්වයක් වන අතර සාමාන්‍ය උෂ්ණත්වය 26 - 28 අතරය. උෂ්ණත්වය අධික මාස ලෙස මැයි, ජූනි, ජූලි හා අගෝස්තු ද අවම මාස ලෙස දෙසැම්බර් හා ජනවාරි ද දැක්විය හැක.
- මෙම කලාපයට නිර්දේශිත භූමි පරිහරණයන් වශයෙන් තේ, රබර් වගාවන් මෙන්ම මිශ්‍ර බෝග සහිත ගෙවතු ද පෙන්වා සී ඇති අතර, වී වගාව මෙන්ම කුරුඳු වැනි අපනයන බෝගද පෙන්වා දී ඇත.


**මැදරට තෙත් 1a**

- කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 21% ක පමණ වපසරියක් මැදරට තෙත් 1a යන කෘෂි පාරිසරික කලාපයට අයත්ය. විශේෂයෙන්ම
 කොට්ඨාසයේ ඊසාන දිග සිට ගිණිකොණ දිශාවන්ට මායිම්ව කුඩා තීරුවක් ලෙසින් මැදරට තෙත් 1a කලාපය ව්‍යාප්තව ඇත.
- මෙම කලාපයට විශේෂිත ලක්ෂණ වනුයේ අධික ලෙස විච්චින්න වූ කඳු සහිත බිම් හා රළි සහිත බිම් පිහිටා තිබීමත්, ප්‍රධාන පාංශු භාණ්ඩය රතු කහ පොඩ්සොලික් පස වන අතර පාංශු පැතිකඩ ගත් විට A1 ස්ථරය ප්‍රමුඛ නොවීමත්, වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 3300 ට වැඩි වීමත්, වසර පුරා ව්‍යාප්ත වූ වර්ෂාපතනයක් වාර්තා වීමත්, මුහුදු මට්ටමේ සිට මීටර් 300 - 900 අතර උච්ඡත්වයක් වාර්තා වීමත්ය.
- මෙම කලාපයට නිර්දේශිත භූමි පරිහරණයන් වශයෙන් තේ වගාවත්, ස්වභාවික වනාන්තරත් නම් කර තිබීම විශේෂිතය.

**උඩරට තෙත් 1**

- කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 3% ක පමණ කුඩා වපසරියක් උඩරට තෙත් 1 යන කෘෂි පාරිසරික කලාපයට අයත්ය. විශේෂයෙන්ම
 කොට්ඨාසයේ නැගෙනහිර කෙළවරට වන්නට මෙම කුඩා වපසරිය අයත්ය.
- මෙම කලාපයට විශේෂිත ලක්ෂණ වනුයේ අධික ලෙස විච්චින්න වූ කඳු සහිත බිම් හා රළි සහිත බිම් පිහිටා තිබීමත්, ප්‍රධාන පාංශු භාණ්ඩය රතු කහ පොඩ්සොලික් පස වන අතර කඳුකර රෙගොසෝල් හා ලිතොසෝල් පස වාර්තා වීමත්, වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 3100 ට වැඩි වීමත්ය.
- මෙම කලාපයට නිර්දේශිත භූමි පරිහරණයන් වශයෙන් තේ වගාවත්, ස්වභාවික වනාන්තරත්, වන වගාවනුත් නම් කර තිබීම විශේෂිතය.

**සිතියම් අංක 13: කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කෘෂි පාරිසරික කලාප ව්‍යාප්තිය**


කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කෘෂි පාරිසරික කළාප ව්‍යාප්තිය
N
සුචිය
කෘෂි පාරිසරික කළාප
WL1a - පහතරට තෙත් 1a
WM1a - මැදරට තෙත් 1a
WU1 - උඩරට තෙත් 1
ප්‍රා.ලේ.කො. මායිම
0 1,150 2,300 4,600 Meters
මූලාශ්‍රය : මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 1:50,000 පරිමාණ රත්නපුර දිස්ත්‍රික් කෘෂි පාරිසරික කළාප සිතියම
184000
180000
176000
172000
168000
144000
148000
152000
156000
160000
164000

## සිතියම් අංක 14: කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම් පරිහරණය

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේදී දිවයිනේ ඉඩම් පරිහරණ සිතියම යාවත්කාලීන කර ඇති අතර, එම දත්තයන්ට අනුව කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ඉඩම් පරිහරණය සිතියම පහත සිතියම් අංක 14 මගින් පෙන්වා දී ඇත. එම සිතියමට අදාළව සකසන ලද දත්තයන් පහත වගු අංක 08 මගින් ද පෙන්වා දී ඇත.


එම දත්තයන්ට අනුව කොට්ඨාසයේ මුළු භූමියෙන් 56% ක් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගැනෙන අතර 28% ක් ගෙවතු වශයෙන් ද, 14% ක් වනාන්තර ප්‍රදේශ වශයෙන් ද වාර්තා වෙයි (ප්‍රස්ථාර අංක 05).

ගෙවතු වගා බිම් විශාල ප්‍රදේශයක ව්‍යාප්තව පවතී. ගංගා නිම්න ප්‍රදේශවල සහ අනෙකුත් තැනි බිම්වල සහ රැලි සහිත කඳු ප්‍රදේශවල මෙම ගෙවතු වගා බිම් දැකිය හැකිවේ. වගී ප්‍රමාණය හෙක්ටයාර් 4947.25 ක් පමණ වෙයි.

කොට්ඨාසයේ විශාල වශයෙන් ඇත්තේ වගා බිම්ය. වගා බිම් වශයෙන් හඳුන්වනු ලබන්නේ රබර්, තේ, පොල්, මිශ්‍ර භෝග, වී ඇතුළු වාර්ෂික භෝග, හේන් ගොවිතැන් ආදිය සහ වර්ෂාපෝෂිත උස්බිම් වගාව කෙරෙන ප්‍රදේශයි. මේ වගා බිම් මුළු භූමියෙන් 56% ක වපසරියක ව්‍යාප්තව පවතී.


වනාන්තර ව්‍යාප්තිය සැලකීමේදි නැගෙනහිර ප්‍රදේශයේ කඳු ආශ්‍රිතව වනාන්තර ඉතා සුළු ප්‍රදේශයක ව්‍යාප්තව පවතී. වනාන්තර, විවෘත වනාන්තර, ලඳු බිම්, වන වගා මේ වර්ගයට අයත්වේ. එය මුළු භූමියෙන් 14 % ක ප්‍රමාණයකි.

**ප්‍රස්ථාර අංක 05: 2017, යාවත්කාලීන කරන ලද ප්‍රධාන භූමි පරිහරණ දත්ත**




ප්‍රධාන භූමි පරිහරණ බාණ්ඩයන් 2017 ඉඩම් පරිහරණ සිතියම හා ඊට පෙර පැවති ඉඩම් පරිහරණ සිතියමෙහි දත්ත සමඟ සැසඳීමක් පහත ප්‍රස්ථාර අංක 06 මගින් පෙන්වා දී ඇති අතර, එම තොරතුරු වලින් අනාවරණය වන විශේෂිත කරුණ නම් කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පැවති වනාන්තර ප්‍රදේශ යම් පමණකට අඩු වී ඇති බවත්, ගෙවතු මෙන්ම රබර් වගා ප්‍රදේශ යම් පමණක වැඩි වී ඇති බවත්ය. තේ වගාව ගත් කළ 2017 වර්ෂයේ දත්තයන්ට අනුව විශාල වැඩි වීමක් පෙන්නුම් කෙරෙන අතර, පොල් වගාවේ යම් අඩු වීමක් සිදුව ඇති බවත් පැහැදිලිය.

**ප්‍රස්ථාර අංක 06:** **2017, හා ඊට පෙර පැවති දත්තයන්ට අනුව ප්‍රධාන භූමි පරිහරණයන්**





| | වනාන්තර ප්‍රදේශ | ගෙවතු ප්‍රදේශ | තේ වගාව | රබර් වගාව | පොල් වගාව | කුඹුරු ඉඩම් |
|---|---|---|---|---|---|---|
| 2017 - දත්ත(හෙක්ටයාර) | 2412.42 | 4947.25 | 2718.05 | 4745.95 | 43.67 | 1912.68 |
| 2017 ට පෙර පැවති දත්ත(හෙක්ටයාර) | 2856.66 | 4450.22 | 659.45 | 4188.07 | 164.86 | 1936.02 |

**වගු අංක 08: කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ භූමි පරිහරණය - 2017 යාවත්කාලීන දත්තයන්ට අනුව**

| | ඉඩම් පරිහරණය | මුළු භූමි ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|---|
| **01** | **වනාන්තර බිම්** | |
| i | ඝන වනාන්තර | 1809.76 |
| ii | විවෘත වනාන්තර | 254.11 |
| iii | වනවගා | 38.45 |
| iv | ලඳු කැළෑ | 310.10 |
| v | ගල් තලා | 70.45 |
| **02** | **භාවිතා වන කෘෂිකාර්මික භූමි** | |
| i | ගෙවතු වගාව | 4947.25 |
| ii | වී වගාව | 1912.68 |
| iii | තේ වගාව | 2718.05 |
| iv | රබර් වගාව | 4745.95 |

| | | |
|---|---|---|
| v | පොල් | 43.67 |
| vi | රඹුටන් | 10.70 |
| vii | කුරුඳු | 2.60 |
| viii | මිශ්‍ර බෝග | 277.35 |
| ix | මිරිදිය මසුන් වගා | 3.29 |
| **03** | **අත්හරින ලද කෘෂිකාර්මික භූමි** | |
| i | අත්හරින ලද වී වගාව | 88.96 |
| ii | අත්හරින ලද තේ වගාව | 6.24 |
| iii | අත්හරින ලද රබර් වගාව | 3.25 |
| **04** | **වෙනත් පරිහරණයන්** | |
| i | පතල් කැණීම් ප්‍රදේශ | 38.40 |
| ii | කාර්මික ජනපද | 20.18 |
| iii | ක්‍රීඩා පිටි | 2.47 |
| iv | ගල් කොරි | 2.72 |
| v | සුසාන භූමි | 0.49 |
| **05** | **ජල තලා** | |
| i | ඇළ, දොළ, ගංගා | 121.72 |
| ii | කුඩා වැව් | 7.63 |
| iii | වගුරු බිම් | 0.99 |
| **06** | **භාවිතා නොවන බිම්** | **11.56** |

**සිතියම් අංක 14:** **කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ භූමි පරිහරණය - 2017 යාවත්කාලීන දත්තයන්ට අනුව**


කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම් පරිහරණය
ඇහැලියගොඩ ප්‍රා.ලේ. කොට්ඨාසය
කෑගල්ල දිස්ත්‍රික්කය
කිරිඇල්ල ප්‍රා.ලේ. කොට්ඨාසය
රත්නපුර ප්‍රා.ලේ.කොට්ඨාසය
සූචිය
N
ඝන වනාන්තර
විවෘත වනාන්තර
කෘෂි වන වගා
ගල් තලා
ලඳු කැළෑ
කුඹුරු
රබර් වගා
තේ වගා
පොල් වගා
කුරුඳු වගා
රඹුටන් වගා
මිශ්‍ර බෝග
අත් හරින ලද කුඹුරු
අත් හරින ලද රබර්
අත් හරින ලද තේ
ගෙවතු වගා
මිරිදිය මසුන් වගා
කාර්මික ජනපද
පතල් කැණීම් ප්‍රදේශ
ගල් කොරි
සුසාන භූමි
ක්‍රීඩා පිටි
භාවිතා නොවන බිම්
කුඩා වැව්
ඇළ, දොළ, ගංගා
වගුරු බිම්
ප්‍රා.ලේ.කො.මායිම
0 1,100 2,200 4,400 Meters
185000
180000
175000
170000
145000
150000
155000
160000
165000